**ශීර්ෂය - 273, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශයන් පහත සඳහන් ඡේද සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- |
| 3.5 (අ) | අලුත්වැඩියා කළයුතු නිල නිවස වාසස්ථානයට සුදුසු අයුරින් පිළිසකර ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුයි. | 3.5 (ඉ) |
| 3.5 (ආ) | ප්‍රමාදයකින් තොරව ඉඩම ලබාගෙන අදාල කටයුතු සම්පූර්ණ කළයුතුය. | 3.7 (ඇ) |
| 3.7 (අ) | 14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කළයුතුව තිබිය දී ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබු බැවින්, ඒ පිළිබඳව පරීක්ෂා කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගතයුතුය. | 3.6 (ආ) |
| 3.8 | අදාල නිර්දේශ ලබාගත යුත්තේ ශක්‍යතා අධ්‍යයන අවස්ථාවේ දී වන අතර, ලබාදෙනු ලැබූ නිර්දේශ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල ද යන්න සළකා ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුය. | 3.7 (උ) |
| 3.9 (අ) | වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරීගෙන් අයකල යුතුය. | 3.6 (අ) |
| 3.9 (ආ) | කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. | 2.1 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.1.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/08 – Volume දරන 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු හඳුනාගත් ඉඩම් සහ ගොඩනැඟිලි තක්සේරු කරවා ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවට හඳුනාගත් ග්‍රාම නිලධාරී කාර්යාල 49, නිල නිවාස 06, රජයේ පොදු ගොඩනැඟිලි 13 ක් හා ප්‍රජා ශාලාවක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි | තක්සේරු කිරීමෙන් පසු 2023 වර්ෂයේ දී ගිණුම්ගත කරමි. | තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ට අයත් විධායක සහ විධායක නොවන එකතුව වර්ග අඩි 12693 ක් වූ නිල නිවාස 11 ක් සහ නිල නිවස පිහිටි ඉඩම්වල එකතුව අක්කර 6.6 රූඩ් 02 පර්චස් 12.7 ක් වූ ඉඩම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැඟිලිවල විස්තර තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තක්සේරු කර 2023 වර්ෂයේ දී ගිණුම් ගතකරන බව දන්වා සිටිමි. | තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාදම්පේ ගොවිජන සේවා කාරක සභාව භාවිතා කර නැවත භාර දී තිබූ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, තක්සේරු කර ගිණුම්ගත කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන තිබූ වත්කම් ලැයිස්තුවට ද එය ඇතුලත් කර නොතිබුණි. | ගොඩනැඟිලිවල විස්තර තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තක්සේරු කර 2023 වර්ෂයේ දී ගිණුම් ගතකරන බව දන්වා සිටිමි. | තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ බෝට්ටු හා එන්ජිමක්, ජීවිතාරක්ෂක කබා 18 ක්, මෙගා ෆෝන් එකක්, වතුර ටැංකි 08 ක්, වතුර මෝටර් 04 ක් සමඟ ට්‍රැක්ටර් හා බවුසර් 08 ක් පවරා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයෙන් ලැබී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී ඇති වත්කම්වල පිරිවැය ලබාගන 2023 වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වත්කම්වල පිරිවැය ලබාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් 13 ක් හා ට්‍රේලර් 13 ක්ද, ලොරි බව්සර් 09 ක්ද පවරා ගෙන ගිණුම් ගත කර නොතිබුණි. | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ලබාදී ඇති ට්‍රැක්ටර් හා ටේලර් 13 2023 වර්ෂයේ දී ගිණුම්ගත කරන බව දන්වා සිටින අතර, ලොරි රථ පිළිබඳව උපදෙස් ලබාගෙන කටයුතු කරන බව දන්වමි. | ලැබී ඇති සියලු වාහනවල පිරිවැය ලබාගෙන ගිණුම් ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගෙන සහල් කර ලබාදීමේ පදනම යටතේ රජය විසින් 2020/21 මහ කන්නයේ දී වී මෝල් හිමියන් 14 දෙනෙකු වෙත ලබාදෙන ලද රු.100,161,424 ක මුදල වෙනුවෙන් ලැබිය යුතු රු.32,685,875 ක් වටිනා සහල් කි.ග්‍රෑ. 422,502 ක් සහ 2021 යල කන්නයේ දී වී මෝල් හිමියන් 19 දෙනෙකුට ලබාදෙන ලද රු.77,880,000ක මුදල සඳහා ලැබිය යුතු සහල් කිලෝ ග්‍රෑම් 1,006,687ක් 2023 මැයි 30 දින වන විටත් ලැබී නොතිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කල චක්‍රලේඛයේ සඳහන් සහල් මිල පදනම් කරගෙන ලබා නොදුන් සහල් සඳහා වටිනාකම ලබා දීමට 2023 ජුනි 30 දක්වා සහන කාලයක් ලබාදී ඇති බැවින්, එදිනට පෙර සහල්වල මූල්‍යමය අගය ගෙවන ලෙස සහල් මෝල් හිමියන් දැනුවත් කර ඇත. | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u><br><br>මුදල් රෙගුලාසි 109 | 2,384,780 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අනතුරු 13 කට අදාලව කපා නොහල අලාභහානි සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් වලින් කපා හැරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවලදී ගත් තීරණයක් මත කමිටුවක් පත්කර අදාල කටයුතු කරමින් සිටියි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ii)** **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 චක්‍රලේඛය | - | රාජ්‍ය ආයතනයක් වෙතින් සේවා ලබන මහජනතාවට අවශ්‍යතාවන් කඩිනමින්ම, කාර්යක්ෂමව ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරනු ලබන බවට ලිඛිත බැඳීමක ස්ථාපිත කිරීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතන විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දියයුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා තිබුණු අතර, මාස 06 ක් ඇතුළත සියළු රාජ්‍ය ආයතන ඒ අනුව කටයුතු කිරීම අපේක්ෂා කර තිබුණ ද, ඊට අනුකූලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | 2020 වසරේ සිට 2023 දක්වා රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් සාමාන්‍ය මට්ටමින් කාර්යාල කටයුතු සිදු නොවූ බැවින්, සේවාලාභී ප්‍රඥප්තිය අනුව ක්‍රියා කිරීමට සිදු නොවීය. වර්තමානයේ පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දීමට ක්‍රියා කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල කටයුතු කළ යුතුය. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය | - | ආයතන ප්‍රධානී ඇතුළුව සියළුම සේවකයින් තම පැමිණීම ඇඟිලි සළකුණු යන්ත්‍රයක් හා ලේඛනයක් මඟින් සනාථ කළයුතු බව දන්වා තිබුණ ද, මහවැව, ආණමඩුව හා කරුවලගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය හරහා සටහන් කිරීමකින් තොරව පැවතුණ අතර පැමිණීම් හා පිටවීම් ලේඛනයේ තොරතුරු මත අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර අක්‍රියව පැවැතුණ ද, 2023 වර්ෂයේ වියදම් සීමාකිරීම මත යන්ත්‍ර මිලදී ගැනීමට නොහැකි විය. මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ වන විට යථාවත් කර ඇති අතර, ප්‍රාග්ධන වියදම් සඳහා අවසර ලබාදුන් පසු මිලදී ගෙන දීමට ක්‍රියාකරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කඩිනමින් අවශ්‍ය කටයුතු කළයුතුය. |
| (ඇ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කාර්ය පරිපාටික රීති 01 වන කාණ්ඩයේ XVII | - | ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටියේ 2.2.2 ජේදය ප්‍රකාරව එකම සේවා ස්ථානයේ වසර 05 ට වැඩි සේවා කාලයක් | ඒකාබද්ධ සේවයේ අවුරුදු 5ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් පිළිබඳව තොරතුරු උපලේඛන සකස් කර ඒකාබද්ධ | අදාළ චක්‍රලේඛ නීතිරීති ප්‍රකාරව ස්ථාන මාරු පරිපාටිය ක්‍රියා කරවීමට සහ අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| පරිච්ඡේදයේ 202 වගන්තිය හා 2001 අගෝස්තු 22 දිනැති හා අංක 18/2001 චක්‍රලේඛය | සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කළයුතු වුවද, මහකුඹුක්කඩවල, මුන්දලම, පුත්තලම, කරුවලගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2022 දෙසැම්බර් 31 දිනට වසර 5-9 ත් අතර සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් එකතුව 347 දෙනෙකු සම්බන්ධයෙන් යථෝක්ත ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | වශයෙන් ස්ථාන මාරුවීම් ක්‍රමයක් අනුගමනය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ජේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, ඒ තුළ ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය මැන බැලීමට ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කාර්යයන්හි ප්‍රගතිය මැනීමට ප්‍රගති වාර්තාවක් පිළියෙල කිරීම 2022 වර්ෂයේ දී අතපසු වී ඇති බවත්, ඉදිරියේ දී සැකසිය යුතු බවට නිලධාරීන්ට උපදෙස් දෙන ලදි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබූ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 15 න් ව්‍යාපෘති 05 ක් පාසල්වල ඇතුල්වීමේ | මෙම ව්‍යාපෘති වලට අදාල යෝජනා ඉදිරිපත් කරන්නේ හා අනුමත කරන්නේ මන්ත්‍රීවරයා විසින් වන අතර සංශෝධනය කළයුත්තේ ද | ප්‍රමුඛතාවය ලබා දියයුතු සංවර්ධන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුවරු සකස් කිරීමට ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා එක් ව්‍යාපෘතියකට රු.776,000 බැගින් රු.3,880,000 ක් වැයකර තිබුණි. එසේ ම සෑම ඇතුල් වීමේ පුවරුවකම ඉහළින් පාසලේ නම සඳහන් කර තිබූ පුවරුවක් සවිකර තිබූ අතර, ඒ සඳහා රු.80,000 ක් බැගින් රු.400,000 ක් වැයකර තිබුණි.මෙම සියලු පාසල් ග්‍රාමීයව පිහිටා තිබූ දුෂ්කර පාසල් වන අතර විශාල පරිමාණයේ ඇතුල්වීමේ පුවරුවක් ඉදිකිරීමට වඩා ප්‍රමුඛතාවය ලබාදිය යුතු සංවර්ධන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මන්ත්‍රීවරයා විසින් ම පමණි. එම යෝජනා පාසලේ විදුහල්පතිගේ ඉල්ලීම මත මන්ත්‍රී සෘජු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදි. | |
| (ආ) | මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකර තිබූ නව කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කටයුතු අවසන් කර තිබුණ ද, එහි පවතින අඩුපාඩු ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගෙන තිබූ අඩුපාඩු 22 න් පඩිපෙළ ඉදිකිරීම ඇතුළු වැඩ විෂයය දෙකක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මුන්දලම නව කාර්යාලය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවල හඳුනාගත් අඩුපාඩු නව ඇස්තමේන්තුවකට ඇතුලත් කර 2023 වර්ෂයේ දී ප්‍රතිපාදන ලැබුනොත් ඉටුකරන බව දන්වා සිටිමි. | හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීමේ දී රජයට සිදුවන පාඩුව අදාල වගකිව යුතු පාර්ශවයන් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වසම් 17 ක ප්‍රතිලාභීන් 159 සඳහා රු.1,903,067 ක් වැයකර කහ වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර, එක් ප්‍රතිලාභියෙකුට ආසන්න වශයෙන් රු.10,000 ක් වටිනා කහ බීජ හා වගා මළු (පොලිෂැක් බෑග්) ලබාදී තිබුණි. කහවල මිල සීඝ්‍ර ලෙස අඩුවෙමින් පැවති අවස්ථාවක එනම් පසුගිය වර්ෂයේ කහ කිලෝග්‍රෑම් එකක් රු.800 – රු. 1,000 ක් අතර පැවති මිල රු.180 ක් දක්වා අඩු වූ අවස්ථාවක දී මිල උච්චාවචනයන් හා අනෙකුත් ආපදා පිළිබඳ ශක්‍යතා අධ්‍යනයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ බැවින් ඵලදාව ලබාගන්නා අවස්ථාව වනවිට කහ කිලෝ ග්‍රෑම් එකක් රු.60 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන්ට රු.2,000 - රු.3,000 ක් අතර ආදායමක් ලැබී තිබුණු | ක්‍රියාත්මක කරන ලද කහ වගා ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කල බවත් වැය කල මුදල වූ රු.1,903,067 කට වඩා රු.3,053,325 ක අමතර ආදායමක් කහවගාකරුවන් උපයා ඇති බව දන්වා සිටිමි. | විගණනය සඳහා අදාල සනාථ කිරීම් සමඟ පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |

අතර එය රජය කහ බීජ හා වගා මළු සඳහා වැය කරන ලද මුදලවත් ආවරණය වී නොතිබුණි.

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ග්‍රාම ශක්ති සමිතිවලට නිකුත් කර තිබුණු මුදල්වලින් මාදම්පේ, නාත්තන්ඩිය, ආණමඩුව හා මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවලට අයත් අක්‍රිය සමිති 45 ක රු.23,913,494 ක මුදලක් වසර 04 ක කාලයක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 12 කට අයත් සමිති 12ක පවතින රු. 9,901,991 ක මුදල් ශේෂය එම සමිති අක්‍රිය වීම නිසා නිශ්කාර්යව පැවතුණි. | වර්තමානයේ දී සෞභාග්‍යා නිෂ්පාදන කාර්යාංශය යටතේ ග්‍රාම ශක්ති වැඩසටහන නැවත සක්‍රීය කරමින් සිටින අතර, අක්රිය සමිතිවල මුදල් සක්‍රීය සමිතිවලට යොමු කිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා සිටිමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,969,975 වැයකර වර්ෂ 05 කට පමණ පෙර ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 04 ක් අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගෙන විනාශවෙමින් පවතින බව ද රු.3,876,375 ක් වැයකර වර්ෂ 05 කට පමණ පෙර ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද දහම් පාසල් ගොඩනැඟිලි 04 ක් හා ආරාමයක වැසිකිළි පද්ධතියක් මේ දක්වා අපේක්ෂිත අරමුණ වෙනුවෙන් භාවිතා කළ හැකි තත්ත්වයට සම්පූර්ණ වී නොතිබුණි. | ව්‍යාපෘති 04න් 02 ක් දැනට භාවිතා කළ හැකි මට්ටමට නිමකර ඇති බවත්, අනෙකුත් ව්‍යාපෘති භාවිතා කළ හැකි මට්ටමට වැඩ නිමකර ගැනීමට කටයුතු සිදුකර ගනිමින් පවතින බව දන්වා සිටින බව දන්වා සිටිමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළයුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------ |
| (අ) | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මධ්‍යම රජය සතු ඉඩම්වල අයිතිය අනෙකුත් දෙපාර්තමේන්තුවලට පැවරීම් සම්පූර්ණ නොවී තිබිය දී වෙනත් දෙපාර්තමේන්තු මඟින් භාවිතා වන ඉඩම්වල අනවසර ක්‍රියාකාරකම් වාර්තා වූ විගස ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කිරීම පමණක් සිදුකරනු ලබන අතර, පසුවිපරමක් සිදුකර වසර අග වාර්ෂික සමාලෝචන වාර්තාවක් සකස් කර නොතිබුණි. | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වෙනත් දෙපාර්තමේන්තුවල පාලනයට යටත් වන, ඉඩම්වල සිදුවන අනවසර ක්‍රියාකාරකම් මා වෙත වාර්තා වූ විගස, අදාළ දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා යවනු ලබන අතර අදාළ පසුවිපරම් හා එම ආයතන වල ඉල්ලීම්වලට සහය ලබාදෙනු ලබයි. එහෙත් මෙතෙක් වාර්ෂික සමාලෝචන වාර්තාවක් සකස් කර නොමැති අතර ඉදිරියේදී එය සකස් කිරීමට අදාළ උපදෙස් ලබාගෙන සකස් කරනු ලබන බව දන්වා සිටිමි. | රජය සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පුත්තලම, මාදම්පේ, දංකොටුව, ආරච්චිකට්ටුව හා මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සපයා තිබූ ට්‍රැක්ටර් බවුසර් 07ක් නිශ්කාර්යව පැවතුණි. | ජලය බෙදාහැරීමේ අවශ්‍යතාවය උදා නොවූ බැවින් ට්‍රැක්ටර් බවුසර් නිශ්කාර්යව පවතින බව සඳහන් කරමි. | රජයේ වාහන ආරක්ෂා කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස 2021 වර්ෂයේ දී රු.1,504,322 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණ ද, වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ගරා වැටීම වළක්වා ගැනීමට අළුත්වැඩියා කළ අතර, ප්‍රාදේශීය ලේකම්ගේ ඉදිරි පරිහරණය සඳහා නඩත්තු කරමින් පවත්වාගෙන යනු ලබන බව දන්වා සිටිමි. | නිල නිවාස වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2014 වර්ෂයේ සිට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු.9,875,000 ක් වටිනා නිල නිවාස 03 ක් 2023 මාර්තු මාසය වනවිට නිශ්කාර්යව පැවතුණි. | දීර්ඝ කාලයක් අළුත්වැඩියා නොකිරීම නිසා ගරා වැටී ඇති තත්ත්වයට පත්ව ඇති අතර, ප්‍රතිපාදන නොලැබීම මත අළුත්වැඩියා කිරීමට නොහැකි | නිල නිවාසවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විය. | |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යලයවලට අයත් නිල නිවාස පරීක්ෂාවේ දී මහකුඹුක්කඩවල, ආණමඩුව, ආරච්චිකට්ටුව, නාත්තන්ඩිය, මුන්දලම, කල්පිටිය හා හලාවත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවලට අයත් නිල නිවාස 07 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිට නිශ්කාර්යව පැවතුණි. | මහකුඹුක්කඩවල හා ආණමඩුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස ගබඩා වැනි කටයුතු සඳහා භාවිතා කරන බවත්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරියේ දී පරිහරණය සඳහ පවත්වාගෙන යනු ලබන බවත්, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එක් නිල නිවසක් අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින බවත්, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්, කාර්යාලය ආසන්නයේ පදිංචි බැවින්, නිල නිවස භාවිතා නොකරන බවත්, කල්පිටිය නිල නිවස අළුත්වැඩියා කළයුතු බවත් හලාවත පිහිටි ස්ථානය අනුව භාවිතා කිරීමට අපහසු බවත් දන්වා සිටිමි. | නිල නිවාස ආරක්ෂා කර ගැනීමටත් ප්‍රයෝජන ගැනීමටත් අවශ්‍ය කටයුතු කළයුතුය. |
| (ඊ) | වනාතවිල්ලුව, මුන්දලම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවුසර් 03 ක් හා කැබ් රථ දෙකක් දිගු කාලයක සිට අලුත්වැඩියාව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. | අස්ථානගත වූ ලියාපදිංචි සහතික ලබා ගැනීමෙන් අනතුරුව අපහරණය කිරීම සඳහා අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය වහා කඩිනමින් සිදු කරනු ඇත. | වත්කම් ආරක්ෂිතව ගාල්කර තැබිය යුතු අතර, අලුත්වැඩියා කළ නොහැකි වත්කම් විධිමත්ව අපහරණය කළයුතුය. |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------ |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් ඒකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය භාගයා ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණු ද, පුත්තලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක/(1)/2021 හා | 2021 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික් මිල කමිටුව පවත්වන ලද්දේ පළමු කාර්තුවේ පමණක් වන බැවින් දෙවන අර්ධය සඳහා වයඹ පළාත් මිල කමිටු තීරණය මත කටයුතු කර ඇත. එබැවින් ඒ සඳහා වැඩිපුර ගෙවීමක් සිදුව නොමැති බව දන්වමි. | වැඩිපුර ගෙවීම් කරන ලද මුදල අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු ඝන මීටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි. | | |
| (ආ) | ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැඟිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබූ අතර, බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි. | ඉදි කිරීමේ පැවති අඩුපාඩු මත එවකට සිටි නිලධාරීන් විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා කර ඇත. ඒ අනුව, ආරවුල් විනිශ්චය මණ්ඩල ක්‍රියාවලිය, බේරුම්කරණ ක්‍රියාවලියට යාම හේතුවෙන් මෙම ගෙවීම් ප්‍රමාද වූ අතර බේරුම්කරණයේ තීරණය අනුව මෙම ගෙවීම් සිදු කරන ලදී. එම නිසා මෙම ප්‍රමාද පොලී ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට සිදුවිය. | 14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කළයුතුව තිබිය දී ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳ වගකීම් නිශ්චය කළ යුතුය. |
| (ඇ) | ඉහත කාරණයට අදාලව ඉදිකිරීම්වල දෝෂ නිවැරදි කිරීමට රු.33,770,564 ක ඉංජිනේරු ඇස්තමේන්තුවකින් සහතික කර තිබුණ ද, බේරුම් කරන ක්‍රියාවලියේ දී එය නොසලකා හැර කටයුතු කිරීමෙන් රජයට රු.18,235,507 ක අලාභයක් සිදුවී තිබුණි. | මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශය මගින් ලබාදුන් වාර්තාවට අනුව සැලසුම් දෝෂ දක්වා නැති අතර, අත්තිවාරමේ පතුළ පිහිටවිය යුතු මට්ටමේ යම්කිසි ගැටළුකාරී තත්ත්වයක් සඳහන් කර ඇත. නමුත් ගොඩනැගිල්ල භාවිතයට නුසුදුසු බව සඳහන් කර නැති අතර දැනට මෙම ගොඩනැගිල්ල භාවිතයට ගනු ලබන බැවින් අදාළ ආයතනයට විරුද්ධව ක්‍රියා මාර්ග ගත නොහැකි බව දන්වා සිටිමි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොට්ඨාශ සංවර්ධනය යටතේ පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වැඩ අවසන් වටිනාකම රු.259,601ක් වූ අඩම්මන ප්‍රජාශාලාවේ වැට ඉදිකිරීම යටතේ අවසාන බිල්පත් අනුව වැටෙහි දිග මීටර් 116 ක් සඳහා එක් මීටරයකට රු.2,234 ක් බැගින් රු.259,144 ක් ගෙවීම් කර තිබුණ ද, වැටෙහි දිග භෞතික පරික්ෂාවේ දී මීටර් 106.5 ක් වූයෙන් මීටරයකට රු.2,234 බැගින් මීටර් 9.5 කට රු.21,223 ක් වැඩිපුර ගෙවා තිබුණි. විගණනය පෙන්වාදීමෙන් පසු පිළිතුරට අනුව වැඩිපුර ගෙවූ මුදල ආපසු අය කරගෙන තිබුණ මුත්, අදාල සංවර්ධන නිලධාරීන් ක්ෂේත්‍ර නිලධාරීන් හා ව්‍යාපෘති පරික්ෂාව ලෙස දක්වා ගමන් වියදම් හා නිවාඩු දින වැටුප් ලබාගන්නා නිලධාරීන් නිසි පරිදි රාජකාරි ඉටුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය භෞතිකව මිනුම් ගැනීමේ දී අත්වැරදීමකින් මීටර් 9.5 ක් වෙනුවෙන් රු.21,223 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති බැවින්, එම මුදල විගණනය දැනුම් දීමෙන් පසු ආපසු අයකරගත් බවත්, තාක්ෂණික නිලධාරිගෙන් නිදහසට කරුණු විමසා ඇති බවත් දන්වා සිටිමි. | ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරී සාමූහිකව වගකිව යුතුය. |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වෙන්නප්පුව, ආණමඩුව හා ආරච්චිකට්ටුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනට අදාල නිලධාරීන් 05 දෙනෙකු සඳහා වන මූලික විමර්ශන නිර්දේශයන් තුළින් චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නියම කර තිබුණ ද, විගණිත දින වන තෙක් එම නිලධාරීන්ට අදාලව චෝදනා පත්‍ර නිකුත් කර නොතිබුණි. | නිලධාරීන් 03 දෙනෙකුට අදාලව චෝදනා පත්‍ර භාරදී ඇති බවත්, නිලධාරීන් 05 දෙනෙකුට අදාලව චෝදනා පත්‍ර කෙටුම්පත් කර අදාල අමාත්‍යාංශ වෙත යොමු කර ඇත. | සිහිකැඳවීම් යවා චෝදනා පත්‍ර ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වර්තමාන තක්සේරු වටිනාකම රු.255,800,000 ක් වූ නිල නිවාස 08 පිහිටි අක්කර 01 යි රූඩ් 02 යි, පර්චස් 14.7 ක් වූ ඉඩම පුත්තලම නගර සභාව විසින් ඉදිකරනු ලබන ඇල්ෆා වෙළඳ සංකීර්ණය හා එහි රථවාහන අංගනය | දෙපාර්ශවයම එකඟව ඇති ආකාරයට කඩිනමින් කටයුතු නිම කරන ලෙස පුත්තලම නගර සභාවට මගේ අංක DSP/ADM.4/DEV/02/10/2 හා 2023.04.06 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති අතර ප්‍රමුඛත්වය | ප්‍රමාදයකින් තොරව ඉඩම් ලබාගෙන සැලසුම් කල පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා පුත්තලම නගර සභාවට පවරා ගෙන ඒ වෙනුවට පුත්තලම ඩිපෝව අංගනය අසල නගර සභාවට අයත් ඉඩමෙන් අක්කර 01 ක් ලබාදී, නිල නිවාස 08 හි වර්තමාන තක්සේරු වටිනාකමට සමාන නිල නිවාස 04 ක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට එකඟතාවය ලබාගෙන තිබුණු අතර, පුද්ගලයින්ට පදිංචියට සුදුසු තත්ත්වයේ ඇති මෙම නිල නිවාස 08 න් 05 ක තක්සේරු කිරීමටත් පෙර කඩා ඉවත් කර තිබුණි. එසේ ම 2023 මාර්තු වන විටත් ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ලබා දී මෙම කර්තව්‍ය නිම කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදි. | |
| (ඈ) | 1999 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 9 ක් වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදී තිබුණු අතර, එයින් නිවාස 08 කින් මේ දක්වා මාසික කුලී ගාස්තු අයකර ගෙන නොතිබුණි. ආපදා කළමනාකරණ අංශය වෙත ලබාදී තිබූ නිල නිවාස 2022 වර්ෂයේ දී රු.1,280,862 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණු මුත් ගාස්තු අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. | ගාස්තු අය කිරිමකින් තොරව රාජ්‍ය ආයතනවලට ලබා දී ඇති නිල නිවාස සඳහා එකී රාජ්‍ය ආයතනවලින් කුලියක් අය කිරීමට හෝ එම ආයතනවලට එකී ගොඩනැගිලි පවරා දී හෝ කඩිනමින් ක්‍රියා කරන ලෙස අදාළ නිලධාරින්ව දැනුවත් කළ අතර විස්තරාත්මක වාර්තාවක් වහාම ලබාදෙමි. | වෙනත් රාජ්‍ය ආයතනවලට රජයේ නිලධාරීන්ට ලබාදී ඇති නිල නිවාසවලින් කුලී අයකර ගත යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දින වන විට නිල නිවසක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2019 ජනවාරි මාසයේ සිට නිල නිවසක් ඉල්ලුම් කර සිටි නිලධාරීන් 20 දෙනෙක් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොරොත්තු ලේඛනයෙහි සිටි නමුත්, නිල නිවාසවල වසර 05 ඉක්මවා පදිංචි වී සිටින නිලධාරීන් 07 ක් ඒවායෙහි වර්තමානය වන විටත්, පදිංචිව සිටී. | පදිංචි කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන්ගේ පදිංචි කාලය දීර්ඝ කිරීම මෙම මාසය සිට අත්හිටුවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඊ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 18 කට අයත් එකතුව රු. 5,816,107 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාලව ව්‍යාපෘති 595 ක අයත් නිදහස් කලයුතු රු.36,519,589 ක වටිනාකමින් යුත් රඳවුම් මුදල් 2022 දෙසැම්බර් 31 දින විටත් නිදහස් කර නොතිබුණි. | ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම හේතුවෙන් රඳවුම් මුදල් නිදහස් කිරීමට නොහැකි වී ඇත. 2023 වර්ෂයේදී ද අක් මුදල් ඉල්ලුම් කළ ද, මෙතෙක් අක් මුදල් ලැබී නොමැත. | අක් මුදල් ලබාගෙන රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ දී ආසන්නයේ පිහිටා ඇති අධි බලැති විදුලි රැහැන් පවතී නම් තිරස් හා සිරස් දුරස්ථතාවය (Horizontal & Vertical Distance) හා එමඟින් ශාරීරික ව ඇතිවිය හැකි චුම්භක (Magnetic Impact) බලපෑම සැලකිල්ලට ගෙන කටයුතු කළයුතු වුවද, ඒ පිළිබඳව සැළකිල්ලක් නොදක්වා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරමින් පවතින බව නිරීක්ෂණය විය. බිත්තියේ සිට අඩි 2.5 ක් ආසන්නයේ ඇති මෙම විදුලි රැහැන් ඉවත් කර දෙන ලෙස ගොඩනැගිල්ලේ 03 වන අදියර ඉදිකරන අවස්ථාවේ දී විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර, ඒ සඳහා රු.4,023,389 ක් ගෙවිය යුතු බව දන්වා තිබුණි. | විදුලිබල මණ්ඩලය විසින් 2021.08.06 දින රු. 4,023,989ක් වටිනා ඇස්තමේන්තුවක් යොමු කර තිබුණ ද, මේ වන විට සියලු ඉදි කිරීම් අවසන් බැවින් මෙම රැහැන් පද්ධතිය ඉවත් කිරීමට අවශ්‍ය නොවන බවත්, මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමේ දී එය බාධාවක් නොවන බවත් ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක වප/හලා/ප්‍රලි/15 සහ 2022.07.25 දිනැති ශක්‍යතා වාර්තාව මගින් මා වෙත දන්වා ඇත. | පිළිගත හැකි විද්‍යාත්මක පිළිතුරක් ඉදිරිපත් කළයුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 22 ක් විය.<br><br>(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 19 කට අදාලව පුරප්පාඩු 316 ක් සහ සංවර්ධන නිලධාරි තනතුරට අදාලව 133 ක අතිරික්තයක් පැවතුණි.<br><br>(ඇ) 2022 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාලව පරිපාලන නිලධාරී තනතුරු 09 ක්, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු 10 ක්, ග්‍රාම නිලධාරී තනතුරු 115 ක් සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 35 ක් පුරප්පාඩුව පැවතුණි. | නිලධාරීන් ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම, සේවය අතහැර යාම, සේවයෙන් පහ කිරීම වැනි කරුණු හේතුවෙන් තනතුරු පුරප්පාඩු වී ඇති අතර සෑම මසකම හා කාර්තුමය වශයෙන් පුරප්පාඩු පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැන්වීමට කටයුතු කර ඇත. සංවර්ධන නිලධාරි තනතුරු 204 අනුමත කර ගැනීමට මු.රෙ. 71 යටතේ අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එකී අනුමැතිය ලබා ගැනීමේ පදනම මත 2022 වර්ෂයේ නවක පත්වීම් ලද සංවර්ධන නිලධාරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 16 ට අනුයුක්ත කළ අතර එබැවින් සංවර්ධන නිලධාරි අතිරික්තයක් නැති බව දන්වමි. | පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවකයින් සුදුසු ස්ථානවලට අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතුය |